# අධ්‍යයන පොදු සහතික පත්‍ර
# (උසස් පෙළ)
# 12 සහ 13 ශ්‍රේණි

# බුද්ධ ධර්මය
## විෂය නිර්දේශය

**(2017 සිට ක්‍රියාත්මක වේ)**

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
**www.nie.lk**

බුද්ධ ධර්මය

12, 13 ශ්‍රේණි

විෂය නිර්දේශය

ප්‍රථම මුද්‍රණය 2017

C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: ......................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

## හැඳින්වීම

අධ්‍යාපන සංවර්ධනයේ දී විෂයමාලාවට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. ජාතික අවශ්‍යතාවලට ගැළපෙන අයුරින් විෂයමාලා සැකසීම කාලීන අවශ්‍යතාවකි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 6-11 ශ්‍රේණිවල සිසුන්ට 2015 වර්ෂයේ සිට හඳුන්වා දෙනු ලැබූ බුද්ධ ධර්මය නව විෂය නිර්දේශය තුළින් බුදුදහමේ ප්‍රධාන ඉගැන්වීම්, ශාසන ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතිය යටතේ අදාළ ශ්‍රේණිවලට ප්‍රමාණවත් වන පරිදි කරුණු හැදෑරීමට අවස්ථාව සලසන ලදි. එය නිපුණතා පාදකව සිදුවුණි.

එම අරමුණු ඉටුකර ගනිමින් අ.පො.ස. (සා. පෙළ) කඩඉම පසුකර උසස් පෙළට පිවිසෙන ශිෂ්‍යයා මෙම විෂය හැදෑරීමෙන් බුද්ධ කාලීන භාරතීය ආගමික චින්තා මෙන් ම ඊට සාපේක්ෂව බෞද්ධ ඉගැන්වීමේ අර්ථාන්විත බවද, ත්‍රිවිධ රත්නය, බුදු දහමේ මූලික ඉගැන්වීම්, බෞද්ධ ආචාර ධර්ම, ශාසන ඉතිහාසය, බෞද්ධ ආර්ථික හා දේශපාලන දර්ශනය ආදී ක්ෂේත්‍ර පිළිබඳ විස්තරාත්මක, විචාරාත්මක හා තුලනාත්මක ගවේෂණයට යොමු කරවනු ලැබේ.

බුද්ධ ධර්මය විෂය නිර්දේශය හුදෙක් තත් විෂයයේ මූලධර්ම හා න්‍යායාත්මක කරුණු අධ්‍යයනයකට වඩා, ප්‍රායෝගික ජීවන දර්ශනයක් වශයෙන් මෙන් ම විමුක්ති මාර්ගයක් වශයෙන් තම දැනුම ඵලදායකව උපයෝග කරගත හැකි අයුරින් සකස් කොට ඇත. තව ද විද්‍යාර්ථියා තුළ විචාරශීලීත්වය, ස්වාධීනත්වය හා නිර්මාණශීලී භාවිතය වැඩි දියුණු වන අයුරින් විෂය අන්තර්ගතය සකස් කොට තිබේ.

අසා දැන ගැනීමට වඩා තමා විසින් ම කරුණු එක්රැස් කිරීම, ඒවා බෙදා විග්‍රහ කිරීම, එම කරුණුවල අන්තර්ගතය භාවිතයට ගැනීම පිළිබඳ අවබෝධය ශිෂ්‍යයා තුළ වැඩිදියුණු වන පරිදි විෂය නිර්දේශයේ කරුණු ක්‍රියාවට නැගිය යුතු වේ.

නිපුණතා සියල්ල සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය විෂය දැනුමෙන්, ආකල්පවලින්, කුසලතාවන්ගෙන් හා ජීවන යහපුරුදුවලින් පිරිපුන් බෞද්ධ සාරධර්මවලින් පෝෂණය වූ මනා පෞරුෂයකින් හෙබි ඉගෙනුම්ලාභියෙකුගේ බිහිවීම බලාපොරොත්තු වේ.

# ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා  වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ  සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුම්වත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත්වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන්  සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන  සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
   ආර්ථික සංවර්ධනයට දායක වීම.
   තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
   හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ  වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම.
   යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
   පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලනසේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
   සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**
   ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂය අරමුණු

මිනිසා අවිද්‍යාවෙන් විද්‍යාවටත්, අන්ධකාරයෙන් ආලෝකයටත්, පරාධීනත්වයෙන් ස්වාධීනත්වයටත්, ධීන මානසිකත්වයෙන් අභිමානයටත් පත්කොට මෙලොව හා පරලොව වශයෙන් භෞතික හා ආධ්‍යාත්මික උභයාර්ථ සාධනය වෙත යොමු කිරීමත්, ස්වාර්ථය හා පරාර්ථය සමව සිතන, මානව වර්ගයාට පමණක් නොව සමස්ත සත්ව ප්‍රජාවට මෙන් ම, පරිසරයට ද හිතකාමී සත්පුරුෂ පුද්ගලයකු බවට පත් කිරීමත් බුද්ධ ධර්මය විෂයයෙහි අපේක්ෂාව වේ. එම අපේක්ෂාවන් සාක්ෂාත් කරගනු වස් පහත දැක්වෙන විෂය අරමුණු පිළිබඳ මනා අවධානයකින් ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම ඵලදායක ය.

(1) බුදු සිරිතෙන් සහ පරමාදර්ශී ශ්‍රාවක ශ්‍රාවිකා චරිතවලින් ප්‍රකට වන විශිෂ්ට ගුණ චරිතායනය කරමින් තෙරුවන් ගුණ ඇසුරෙන් පෞරුෂය ගොඩනගා ගැනීම.

(2) සමකාලීන සමයාන්තර චින්තා හා බෞද්ධ ඉගැන්වීම් තුලනාත්මක ව හා විචාරාත්මකව අධ්‍යයනය කරමින් නිදහස්, නිවහල්, විචාරශීලී මනසකින් යුතුව කටයුතු කිරීම.

(3) බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර සත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවදිකමෙන් යුතු, ලෝක ධර්මතා හමුවේ නොසැලෙන ප්‍රායෝගික ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීම.

(4) කර්මය පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් හා විශ්වාසයෙන් යුතු සදාචාර සම්පන්න චරිතයක් ගොඩනගා ගැනීම.

(5) බෞද්ධ ඉතිහාසය පිළිබඳ ගවේෂණශීලීව අතීත ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ උදාර කැපවීම අගයමින් ශාසන සංරක්ෂණයට දායක වීම.

(6) සිය යුතුකම් හා වගකීම් මැනවින් දැන හඳුනාගෙන මනා සමාජ සම්බන්ධතා ජාලයක් සහිත පුද්ගලයකු ලෙස කටයුතු කිරීම.

(7) කරුණාව, දයාව, මෛත්‍රිය හා ශ්‍රද්ධාව වැනි භාවාත්මක ගුණවලින් පෝෂිතව, මිනිසා හා පරිසරය පිළිබඳ සංවේදීව එළඹ සිටි සිහියෙන් හා ප්‍රඥාවෙන් කටයුතු කිරීම.

## ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව දක්වන වගුව

| ජාතික පොදු අරමුණු | විෂය අරමුණු |
|---|---|
| 1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතිය විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව ජාතික ඍජු ගුණය ජාතික සමගිය එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම හා ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම. | (1) බුදු සිරිතෙන් සහ පරමාදර්ශී ශ්‍රාවක ශ්‍රාවිකා චරිතවලින් ප්‍රකට වන විශිෂ්ට ගුණ චරිතායනය කරමින් තෙරුවන් ගුණ ඇසුරෙන් පෞරුෂය ගොඩනගා ගැනීම.<br>(2) සමකාලීන සමයාන්තර චින්තා හා බෞද්ධ ඉගැන්වීම් තුලනාත්මක ව හා විචාරාත්මකව අධ්‍යයනය කරමින් නිදහස්, නිවහල්, විචාරශීලී මනසකින් යුතුව කටයුතු කිරීම.<br>(3) බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර සත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවදිකමෙන් යුතු, ලෝක ධර්මතා හමුවේ නොසැලෙන ප්‍රායෝගික ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීම.<br>(4) කර්මය පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් හා විශ්වාසයෙන් යුතු සදාචාර සම්පන්න චරිතයක් ගොඩනගා ගැනීම.<br>(6) සිය යුතුකම් හා වගකීම් මැනවින් දැන හඳුනාගෙන මනා සමාජ සම්බන්ධතා ජාලයක් සහිත පුද්ගලයකු ලෙස කටයුතු කිරීම.<br>(7) කරුණාව, දයාව, මෛත්‍රිය හා ශ්‍රද්ධාව වැනි භාවාත්මක ගුණවලින් පෝෂිතව, මිනිසා හා පරිසරය පිළිබඳ සංවේදීව එළඹ සිටි සිහියෙන් හා ප්‍රඥාවෙන් කටයුතු කිරීම. |
| 2. වෙනස්වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම හා සංරක්ෂණය කිරීම. | (1) බුදු සිරිතෙන් සහ පරමාදර්ශී ශ්‍රාවක ශ්‍රාවිකා චරිතවලින් ප්‍රකට වන විශිෂ්ට ගුණ චරිතායනය කරමින් තෙරුවන් ගුණ ඇසුරෙන් පෞරුෂය ගොඩනගා ගැනීම.<br>(2) සමකාලීන සමයාන්තර චින්තා හා බෞද්ධ ඉගැන්වීම් තුලනාත්මක ව හා විචාරාත්මකව අධ්‍යයනය කරමින් නිදහස්, නිවහල්, විචාරශීලී මනසකින් යුතුව කටයුතු කිරීම.<br>(3) බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර සත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවදිකමෙන් යුතු, ලෝක ධර්මතා හමුවේ නොසැලෙන ප්‍රායෝගික ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීම.<br>(4) කර්මය පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් හා විශ්වාසයෙන් යුතු සදාචාර සම්පන්න චරිතයක් ගොඩනගා ගැනීම.<br>(5) බෞද්ධ ඉතිහාසය පිළිබඳ ගවේෂණශීලීව අතීත ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ උදාර කැපවීම අගයමින් ශාසන සංරක්ෂණයට දායක වීම.<br>(6) සිය යුතුකම් හා වගකීම් මැනවින් දැන හඳුනාගෙන මනා සමාජ සම්බන්ධතා ජාලයක් සහිත පුද්ගලයකු ලෙස කටයුතු කිරීම.<br>(7) කරුණාව, දයාව, මෛත්‍රිය හා ශ්‍රද්ධාව වැනි භාවාත්මක ගුණවලින් පෝෂිතව, මිනිසා හා පරිසරය පිළිබඳ සංවේදීව එළඹ සිටි සිහියෙන් හා ප්‍රඥාවෙන් කටයුතු කිරීම. |

| | |
|---|---|
| 3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත්වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයකින් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම. | (1) බුදු සිරිතෙන් සහ පරමාදර්ශී ශ්‍රාවක ශ්‍රාවිකා චරිතවලින් ප්‍රකට වන විශිෂ්ට ගුණ චරිතායනය කරමින් තෙරුවන් ගුණ ඇසුරෙන් පෞරුෂය ගොඩනගා ගැනීම.<br>(2) සමකාලීන සමයාන්තර චින්තා හා බෞද්ධ ඉගැන්වීම් තුලනාත්මක ව හා විචාරාත්මකව අධ්‍යයනය කරමින් නිදහස්, නිවහල්, විචාරශීලී මනසකින් යුතුව කටයුතු කිරීම.<br>(3) බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර සත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවදිකමෙන් යුතු, ලෝක ධර්මතා හමුවේ නොසැලෙන ප්‍රායෝගික ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීම.<br>(4) කර්මය පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් හා විශ්වාසයෙන් යුතු සදාචාර සම්පන්න චරිතයක් ගොඩනගා ගැනීම.<br>(5) බෞද්ධ ඉතිහාසය පිළිබඳ ගවේෂණශීලීව අතීත ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ උදාර කැපවීම අගයමින් ශාසන සංරක්ෂණයට දායක වීම.<br>(6) සිය යුතුකම් හා වගකීම් මැනවින් දැන හඳුනාගෙන මනා සමාජ සම්බන්ධතා ජාලයක් සහිත පුද්ගලයකු ලෙස කටයුතු කිරීම.<br>(7) කරුණාව, දයාව, මෛත්‍රිය හා ශ්‍රද්ධාව වැනි භාවාත්මක ගුණවලින් පෝෂිතව, මිනිසා හා පරිසරය පිළිබඳ සංවේදීව එළඹ සිටි සිහියෙන් හාප්‍රඥාවෙන් කටයුතු කිරීම. |
| 4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම. | (1) බුදු සිරිතෙන් සහ පරමාදර්ශී ශ්‍රාවක ශ්‍රාවිකා චරිතවලින් ප්‍රකට වන විශිෂ්ට ගුණ චරිතායනය කරමින් තෙරුවන් ගුණ ඇසුරෙන් පෞරුෂය ගොඩනගා ගැනීම.<br>(2) සමකාලීන සමයාන්තර චින්තා හා බෞද්ධ ඉගැන්වීම් තුලනාත්මක ව හා විචාරාත්මකව අධ්‍යයනය කරමින් නිදහස්, නිවහල්, විචාරශීලී මනසකින් යුතුව කටයුතු කිරීම.<br>(3) බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර සත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවදිකමෙන් යුතු, ලෝක ධර්මතා හමුවේ නොසැලෙන ප්‍රායෝගික ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීම.<br>(4) කර්මය පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් හා විශ්වාසයෙන් යුතු සදාචාර සම්පන්න චරිතයක් ගොඩනගා ගැනීම.<br>(6) සිය යුතුකම් හා වගකීම් මැනවින් දැන හඳුනාගෙන මනා සමාජ සම්බන්ධතා ජාලයක් සහිත පුද්ගලයකු ලෙස කටයුතු කිරීම.<br>(7) කරුණාව, දයාව, මෛත්‍රිය හා ශ්‍රද්ධාව වැනි භාවාත්මක ගුණවලින් පෝෂිතව, මිනිසා හා පරිසරය පිළිබඳ සංවේදීව එළඹ සිටි සිහියෙන් හාප්‍රඥාවෙන් කටයුතු කිරීම. |

| | |
|---|---|
| 5. සුසාමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ වර්ධනය කිරීම. | (1) බුදු සිරිතෙන් සහ පරමාදර්ශී ශ්‍රාවක ශ්‍රාවිකා චරිතවලින් ප්‍රකට වන විශිෂ්ට ගුණ චරිතායනය කරමින් තෙරුවන් ගුණ ඇසුරෙන් පෞරුෂය ගොඩනගා ගැනීම.<br>(2) සමකාලීන සමයාන්තර චින්තා හා බෞද්ධ ඉගැන්වීම් තුලනාත්මක ව හා විචාරාත්මකව අධ්‍යයනය කරමින් නිදහස්, නිවහල්, විචාරශීලී මනසකින් යුතුව කටයුතු කිරීම.<br>(3) බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර සත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවදිකමෙන් යුතු, ලෝක ධර්මතාහමුවේ නොසැලෙන ප්‍රායෝගික ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීම.<br>(4) කර්මය පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් හා විශ්වාසයෙන් යුතු සදාචාර සම්පන්න චරිතයක් ගොඩනගා ගැනීම.<br>(5) බෞද්ධ ඉතිහාසය පිළිබඳ ගවේෂණශීලීව අතීත ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ උදාර කැපවීම අගයමින් ශාසන සංරක්ෂණයට දායක වීම.<br>(6) සිය යුතුකම් හා වගකීම් මැනවින් දැන හඳුනාගෙන මනා සමාජ සම්බන්ධතා ජාලයක් සහිත පුද්ගලයකු ලෙස කටයුතු කිරීම.<br>(7) කරුණාව, දයාව, මෛත්‍රිය හා ශ්‍රද්ධාව වැනි භාවාත්මක ගුණවලින් පෝෂිතව, මිනිසා හා පරිසරය පිළිබඳ සංවේදීව එළඹ සිටි සිහියෙන් හාප්‍රඥාවෙන් කටයුතු කිරීම. |
| 6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම. | (1) බුදු සිරිතෙන් සහ පරමාදර්ශී ශ්‍රාවක ශ්‍රාවිකා චරිතවලින් ප්‍රකට වන විශිෂ්ට ගුණ චරිතායනය කරමින් තෙරුවන් ගුණ ඇසුරෙන් පෞරුෂය ගොඩනගා ගැනීම.<br>(2) සමකාලීන සමයාන්තර චින්තා හා බෞද්ධ ඉගැන්වීම් තුලනාත්මක ව හා විචාරාත්මකව අධ්‍යයනය කරමින් නිදහස්, නිවහල්, විචාරශීලී මනසකින් යුතුව කටයුතු කිරීම.<br>(3) බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර සත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවදිකමෙන් යුතු, ලෝක ධර්මතා හමුවේ නොසැලෙන ප්‍රායෝගික ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීම.<br>(4) කර්මය පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් හා විශ්වාසයෙන් යුතු සදාචාර සම්පන්න චරිතයක් ගොඩනගා ගැනීම.<br>(5) බෞද්ධ ඉතිහාසය පිළිබඳ ගවේෂණශීලීව අතීත ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ උදාර කැපවීම අගයමින් ශාසන සංරක්ෂණයට දායක වීම.<br>(6) සිය යුතුකම් හා වගකීම් මැනවින් දැන හඳුනාගෙන මනා සමාජ සම්බන්ධතා ජාලයක් සහිත පුද්ගලයකු ලෙස කටයුතු කිරීම.<br>(7) කරුණාව, දයාව, මෛත්‍රිය හා ශ්‍රද්ධාව වැනි භාවාත්මක ගුණවලින් පෝෂිතව, මිනිසා හා පරිසරය පිළිබඳ සංවේදීව එළඹ සිටි සිහියෙන් හාප්‍රඥාවෙන් කටයුතු කිරීම. |

| | |
|---|---|
| 7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණදීමේ හැකියාව වර්ධනය කිරිම. | (1) බුදු සිරිතෙන් සහ පරමාදර්ශී ශ්‍රාවක ශ්‍රාවිකා චරිතවලින් ප්‍රකට වන විශිෂ්ට ගුණ චරිතායනය කරමින් තෙරුවන් ගුණ ඇසුරෙන් පෞරුෂය ගොඩනගා ගැනීම.<br>(2) සමකාලීන සමයාන්තර චින්තා හා බෞද්ධ ඉගැන්වීම් තුලනාත්මක ව හා විචාරාත්මකව අධ්‍යයනය කරමින් නිදහස්, නිවහල්, විචාරශීලී මනසකින් යුතුව කටයුතු කිරීම.<br>(3) බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර සත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවදිකමෙන් යුතු, ලෝක ධර්මතා හමුවේ නොසැලෙන ප්‍රායෝගික ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීම.<br>(4) කර්මය පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් හා විශ්වාසයෙන් යුතු සදාචාර සම්පන්න චරිතයක් ගොඩනගා ගැනීම.<br>(5) බෞද්ධ ඉතිහාසය පිළිබඳ ගවේෂණශීලීව අතීත ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ උදාර කැපවීම අගයමින් ශාසන සංරක්ෂණයට දායක වීම.<br>(6) සිය යුතුකම් හා වගකීම් මැනවින් දැන හඳුනාගෙන මනා සමාජ සම්බන්ධතා ජාලයක් සහිත පුද්ගලයකු ලෙස කටයුතු කිරීම.<br>(7) කරුණාව, දයාව, මෛත්‍රිය හා ශ්‍රද්ධාව වැනි භාවාත්මක ගුණවලින් පෝෂිතව, මිනිසා හා පරිසරය පිළිබඳ සංවේදීව එළඹ සිටි සිහියෙන් හාප්‍රඥාවෙන් කටයුතු කිරීම. |
| 8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්ති.ය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම. | (1) බුදු සිරිතෙන් සහ පරමාදර්ශී ශ්‍රාවක ශ්‍රාවිකා චරිතවලින් ප්‍රකට වන විශිෂ්ට ගුණ චරිතායනය කරමින් තෙරුවන් ගුණ ඇසුරෙන් පෞරුෂය ගොඩනගා ගැනීම.<br>(2) සමකාලීන සමයාන්තර චින්තා හා බෞද්ධ ඉගැන්වීම් තුලනාත්මක ව හා විචාරාත්මකව අධ්‍යයනය කරමින් නිදහස්, නිවහල්, විචාරශීලී මනසකින් යුතුව කටයුතු කිරීම.<br>(3) බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර සත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවදිකමෙන් යුතු, ලෝක ධර්මතා හමුවේ නොසැලෙන ප්‍රායෝගික ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීම.<br>(4) කර්මය පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් හා විශ්වාසයෙන් යුතු සදාචාර සම්පන්න චරිතයක් ගොඩනගා ගැනීම.<br>(5) බෞද්ධ ඉතිහාසය පිළිබඳ ගවේෂණශීලීව අතීත ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ උදාර කැපවීම අගයමින් ශාසන සංරක්ෂණයට දායක වීම.<br>(6) සිය යුතුකම් හා වගකීම් මැනවින් දැන හඳුනාගෙන මනා සමාජ සම්බන්ධතා ජාලයක් සහිත පුද්ගලයකු ලෙස කටයුතු කිරීම.<br>(7) කරුණාව, දයාව, මෛත්‍රිය හා ශ්‍රද්ධාව වැනි භාවාත්මක ගුණවලින් පෝෂිතව, මිනිසා හා පරිසරය පිළිබඳ සංවේදීව එළඹ සිටි සිහියෙන් හාප්‍රඥාවෙන් කටයුතු කිරීම. |

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 12 | 1 | 1.1<br>1.2<br>2.1<br>2.2<br>2.3 | 30<br>20<br>12<br>22<br>16 |
| | 2 | 3.1<br>3.2<br>4.1 | 42<br>43<br>15 |
| | 3 | 4.2<br>4.3<br>5.1<br>5.2 | 28<br>26<br>20<br>26 |
| 13 | 1 | 6.1<br>6.2<br>7.1<br>7.2 | 35<br>20<br>25<br>20 |
| | 2 | 8.1<br>8.2<br>9.1 | 30<br>40<br>30 |
| | 3 | 9.2<br>10.1<br>10.2 | 40<br>30<br>30 |

## විෂය නිර්දේශය
## 12 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0<br>ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායයේ එන සිද්ධාර්ථ ගෞතම සම්බුද්ධ චරිතය විමර්ශනාත්මකව අධ්‍යයනය කරමින් චරිතායනය කරයි. | 1.1<br>බුදුරජාණන් වහන්සේගේ අසමසම වූ ආධ්‍යාත්මික ගුණ හඳුනාගෙන ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි. | • නව අරහාදී බුදු ගුණ<br>• මහා කරුණාව<br>• මහා ප්‍රඥාව<br>• ත්‍රිවිද්‍යාව<br>• ඉද්ධිවිධ, දිබ්බසෝත, චේතෝපරිය ඥාන<br>• දසබල ඥානය<br>• චතුර්වෛශාරද්‍ය ඥාන<br>• අකම්පන ඥාන<br>• බුදුරජාණන් වහන්සේගේ ඓතිහාසිකත්වය හා ආශ්චර්යවත් මනුෂ්‍යත්වය<br>• බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වය හා නායකත්වය<br>• බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට දේශනා විලාශ හා ඉගැන්වීම් ක්‍රම | • බුදුරජාණන් වහන්සේගේ අසමසම ගුණ හැඳින ගනියි.<br>• නව අරහාදී බුදුගුණ හා බුද්ධඥාන අසමසම බව පිළිගනියි.<br>• බුදුගුණ දන බුදුරජාණන් වහන්සේ පුදයි.<br>• සාමූහිකව ආමිස ප්‍රතිපත්ති පූජාවේ යෙදෙයි. | 30 |
| | 1.2<br>බුද්ධ චරිතයේ විශිෂ්ට ලක්ෂණ ආදර්ශනය කරයි. | • චින්තන නිදහස අගය කිරීම<br>• සමානාත්මතාව, සහජීවනය හා ආගමික සහනශීලීත්වය<br>• යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී ගුණය<br>• තාදි ගුණය හා පද්මාකාර ජීවිතය<br>• බුදුරජාණන් වහන්සේ පිළිබඳ සමකාලීනයන්ගේ ඇගයීම් | • බුද්ධ චරිතයේ විශිෂ්ට ලක්ෂණ හඳුනා ගනියි.<br>• බුදුරජාණන් වහන්සේ මානව ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයා බව පිළිගනියි.<br>• බුද්ධ චරිතයේ විශිෂ්ට ලක්ෂණ ආදර්ශනය කරයි.<br>• සමානාත්මතාවෙන් හා සහජීවනයෙන් දිවි ගෙවයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0<br>පාලි ත්‍රිපිටකයේ සැකැස්ම හා සද්ධර්මයෙහි සුවිශේෂතා හැඳින ධර්මගරුක ජීවිතයක් ගත කරමින් ධර්ම සංරක්ෂණයට කටයුතු කරයි. | 2.1<br>පාලි ත්‍රිපිටකයේ ව්‍යුහය අධ්‍යයනය කර එහි අන්තර්ගතය සැකෙවින් පැහැදිලි කරයි. | • පිටකත්‍රය හැඳින්වීම<br>• පිටකත්‍රයේ සැකැස්ම | • සූත්‍ර, විනය සහ අභිධර්ම යන පද පිළිබඳ නිර්වචන ඉදිරිපත් කරයි.<br>• ත්‍රිපිටකයේ සැකස්ම පිළිබඳව වැඩිදුර හැදෑරීමට පෙළඹෙයි.<br>• ත්‍රිපිටකයේ ව්‍යුහය පිළිබඳ ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කරයි.<br>• මතු පරපුර සඳහා ත්‍රිපිටක ග්‍රන්ථ ආරක්ෂා කරයි. | 12 |
| | 2.2<br>බුද්ධ ධර්මයේ අනන්‍යතාව හැඳින ධර්ම ගෞරවය ඇති කර ගනියි. | • ස්වාක්ඛාතාදී සවැදෑරුම් දහම් ගුණ<br>• බුදුදහම දේව අනාවරණයක් නොවීම<br>• ආත්මවාදයක් නොවීම<br>• සිතා විමසා පසක් කළ යුතු දහමක්වීම<br>• විශ්ව සාධාරණ බව | • බුද්ධ ධර්මයේ සුවිශේෂතා හඳුනා ගනියි.<br>• ධර්මය පිළිබඳ ගෞරවය ඇතිකර ගනියි.<br>• ධර්ම පත්‍රිකා මුද්‍රණය කර බෙදා හරියි.<br>• සැමවිටම විමර්ශනශීලීව කටයුතු කරයි. | 22 |
| | 2.3<br>බෞද්ධ ඉගැන්වීම් ප්‍රගුණ කරමින් උභයාර්ථ සාධනයෙහි යෙදෙයි. | • උභයාර්ථ සාධනය<br>- මෙලොව පරලොව<br>- ස්වාර්ථ පරාර්ථ<br>• ප්‍රායෝගික ජීවන දර්ශනයක් ලෙස බුදුදහම<br>• බුදුදහම විමුක්ති මාර්ගයක් ලෙස | • උභයාර්ථ සාධනය පිණිස ධර්මයේ උපයෝගීතාව පැහැදිලි කරයි.<br>• බුදුදහම ප්‍රායෝගික ජීවන දර්ශනයක් බව පිළිගනියි.<br>• පාසල තුළ බෞද්ධ සංගමයක් පිහිටුවයි.<br>• සමාජ සුභසාධන කටයුතුවල නිරත වෙයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 03.<br>සංඝ සමාජයේ පරමාර්ථ සහ ප්‍රතිපත්ති විමර්ශනය කර, එහි චිරස්ථිතියට යහ ආකල්පවලින් යුක්තව දායක වෙයි. | 3.1<br>සංඝ සමාජයේ ප්‍රභවය, විකාශය හා පරමාර්ථ අධ්‍යයනය කර සාමූහිකව ක්‍රියා කරයි. | • බුද්ධකාලීන භාරතීය ශ්‍රමණ සමාජය<br>• භික්ඛු සංඝ සමාජයේ ප්‍රභවය<br>• භික්ඛුණී සංඝ සමාජයේ ප්‍රභවය<br>• පැවිද්ද හා උපසම්පදාව<br>• උපසම්පදා ක්‍රම<br>• සතර පාරාජිකා සහ නිස්සය ධර්ම<br>• ශික්ෂාපද පැනවීමේ පරමාර්ථ<br>• වස් විසීම හා පවාරණය<br>• සාංඝික ක්‍රමය | • සංඝ සමාජයේ ප්‍රභවය, විකාශය හා පරමාර්ථ අධ්‍යයනය කරයි.<br>• පැවිද්ද හා උපසම්පදාව ක්‍රමිකව විකාශය වූ බව පෙන්වා දෙයි.<br>• සංඝ සමාජය ආදර්ශනය කරයි.<br>• පොදු සම්පත් ආරක්ෂා කරයි. | 42 |
| | 3.2<br>සඟ ගුණ පිළිබඳ සැදැහැ සිතින් සංඝ සමාජයේ විශිෂ්ට ලක්ෂණ ආදර්ශ කර ගනියි. | • ගුරු ශිෂ්‍ය සම්බන්ධය<br>• සුපටිපන්නාදී නව වැදැරුම් සඟගුණ<br>• බ්‍රහ්මචර්යාව හා අප්පිච්ඡතා, සංතුට්ඨිතා, සුභරතා ගුණ<br>• අත්තහිත පරහිත බව | • සඟගුණ විස්තර කරයි.<br>• සාමූහික සහජීවනය අගයයි.<br>• විහාර කාර්ය සාධක සමිතියක් පිහිටුවීමට දායක වෙයි.<br>• සංඝ සමාජයේ චිරපැවැත්මට කටයුතු කරයි. | 43 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 04.<br>පුද්ගලයා හා සමාජය පිළිබඳ බුද්ධකාලීන ආගමික චින්තා තුලනාත්මකව හා විචාරාත්මකව අධ්‍යයනය කර යථාර්ථවාදීව කටයුතු කරයි. | 4.1<br>පුද්ගලයාගේ ස්වාමිත්වය හා ශක්‍යතාව පිළිබඳ විමර්ශනය කරයි. | • පුද්ගලයා හා සමාජය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම්<br>- ඊශ්වර නිර්මාණ වාදය<br>- ඒ පිළිබඳ බෞද්ධ විචාරය | • පුද්ගලයා හා සමාජය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් විචාරය කරයි.<br>• නිර්මාණවාදි සංකල්පවල නිසරුබව වටහා ගනියි.<br>• ශිෂ්‍ය සමිතියේ දී සමානාත්මතාව අගය කරමින් කතාවක් පවත්වයි.<br>• උස්මිටිකම් නොතකා ක්‍රියා කරයි. | 15 |
| | 4.2<br>ෂට් ශාස්තෘ ඉගැන්වීම් අධ්‍යයනය කරමින් ඒ පිළිබඳ බෞද්ධ ආකල්පය පරීක්ෂා කරයි. | • ෂට් ශාස්තෘවරු<br>- අකිරිය වාදය<br>- නාස්තික වාදය<br>- නියති වාදය (අහේතුඅප්පච්චය වාදය අධිච්චසමුප්පන්න වාදය)<br>- අමරාවික්ඛේප වාදය<br>- සප්තපදාර්ථ වාදය<br>- පුබ්බේකතහේතු වාදය<br>- ෂට්ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් පිළිබඳ බෞද්ධ විචාරය | • ෂට් ශාස්තෘ ඉගැන්වීම් පිළිබඳ බෞද්ධ ආකල්පය විස්තර කරයි.<br>• ෂට් ශාස්තෘ ඉගැන්වීම්වල ඌනතා ඇති බව පිළිගනියි.<br>• සදාචාර විරෝධී ක්‍රියා බැහැර කර දෛනික කටයුතුවල යෙදෙයි.<br>• සමාජ සාරධර්ම ස්ථාපනය කිරීමට දායක වෙයි. | 28 |
| | 4.3<br>සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි බුද්ධි ගෝචර බව පිළිගනියි. | • සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්<br>- සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය හා විකාශය | • සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විවරණය කරයි.<br>• සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි බුද්ධි ගෝචර බව අගය කරයි.<br>• මනුෂ්‍යත්වය අගය කරමින් ජීවත් වෙයි.<br>• වාද භේද බැහැර කර සහයෝගයෙන් කටයුතු කරයි. | 26 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 05.<br>බුදුරජාණන් වහන්සේ සහ භාරතීය භික්ෂූන් වහන්සේ විසින් ධර්ම විනයේ ආරක්ෂාව සඳහා යොදන ලද විධිවිධාන අධ්‍යයනය කරමින් ශාසනික උන්නතියට හා ආරක්ෂාවට කැපවෙයි. | 5.1<br>ධර්ම විනයේ ආරක්ෂාව හා චිර පැවැත්ම පිණිස බුදුරදුන් විසින් යොදන ලද විධිවිධාන හඳුනා ගනියි. | • ශික්ෂාපද හා විනය නීති පැනවීම<br>• ශ්‍රාවක ශ්‍රාවිකාවන් ධර්මදූත කාර්යයෙහි යෙදවීම<br>• තනතුරු පිරිනැමීම<br>- අග තනතුරු<br>- වෙනත් විශේෂ තනතුරු<br>• ගිහි ශ්‍රාවක ශ්‍රාවිකා අනුග්‍රහය | • ධර්ම විනයේ ආරක්ෂාව හා චිර පැවැත්ම පිණිස බුදුරජාණන් වහන්සේ විසින් යොදන ලද ක්‍රියාමාර්ග අධ්‍යයනය කරයි.<br>• බුදුසසුනේ චිර පැවැත්මට අදාළ ක්‍රියාමාර්ග අගයයි.<br>• ධර්ම විනයේ චිර පැවැත්මට දායක වෙයි.<br>• නූතන තාක්ෂණය භාවිත කරමින් ධර්ම සන්නිවේදනයේ යෙදෙයි. | 20 |
| | 5.2<br>බෞද්ධ චින්තනයේ පෝෂණයට හා ව්‍යාප්තියට ධර්ම සංගායනාවලින් සැලසුණු සේවය අධ්‍යයනය කර ශාසන චිරස්ථිතියට ක්‍රියා කරයි. | • ථේරීය සංගායනා<br>- පළමු සංගායනාවේ පසුබිම හා ප්‍රතිඵල<br>- ධර්ම විනය පිටක වශයෙන් බෙදීම<br>- භාණක ක්‍රමය හා ධර්ම විනය සංරක්ෂණය<br>- බුද්දානුබුද්දක ශික්ෂාපද විනිශ්චය<br>- දෙවන සංගායනාවේ පසුබිම හා ප්‍රතිඵල<br>- තෙවන සංගායනාවේ පසුබිම හා ප්‍රතිඵල | • ථෙරවාදී සංගායනාවල පසුබිම හා ප්‍රතිඵල අධ්‍යයනය කරයි.<br>• අභියෝග හමුවේ ධර්ම විනය සංරක්ෂණය කළ යුතු ආකාරය පෙන්වා දෙයි.<br>• ශාසනය වෙනුවෙන් ඉටු කළ යුතු කාර්ය භාරය මැනවින් ඉටු කරයි.<br>• සාමූහික තීරණ ක්‍රියාත්මක කරයි. | 26 |

13 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 06.<br>සත්ත්වයා හා ලෝකය පිළිබඳ බෞද්ධ විග්‍රහය අධ්‍යයනය කර යථාර්ථාවබෝධයෙන් යුත් සමාජ හිතකාමී දිවිපෙවෙතක් ගත කරයි. | 6.1<br>සත්ත්වයා හා ලෝකය පිළිබඳ යථාර්ථය දැක අකම්පිතව කටයුතු කරයි. | • ත්‍රිලක්ෂණය<br>- ඛන්ධ විභාගය<br>- ආයතන විභාගය<br>- ධාතු විභාගය<br><br>• අටලෝ දහම<br>- ත්‍රිලක්ෂණය පිළිබඳ අවබෝධයෙන් හා අෂ්ටලෝක ධර්මයෙහි අකම්පිත වීමෙන් ගොඩනැගෙන ජීවන දර්ශනය | • සත්වයා හා ලෝකය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විශ්ලේෂණය කරයි.<br>• සත්වයා හා ලෝකය පිළිබඳ යථාර්ථය ත්‍රිලක්ෂණය බව පිළිගනියි.<br>• ත්‍රිලක්ෂණයෙන් හා අටලෝදහමින් අකම්පිතව ජීවත් වෙයි.<br>• ගැටලු නිරාකරණයෙහි ලා මෙකී මූලධර්ම උපයෝගී කර ගනියි. | 35 |
| | 6.2<br>ජීව අජීව පරිසරයට හිතකාමීව ජීවත් වෙයි. | • ජීව අජීව පරිසරය කෙරෙහි දැක්විය යුතු ආකල්පය<br>• අන්‍යොන්‍ය යුතුකම් හා වගකීම් | • ජීව අජීව පරිසරය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම හඳුනා ගනියි.<br>• පරිසරය විෂයෙහි හිතකාමී වෙයි.<br>• පාසල් පරිසර සංගමයේ ක්‍රියාකාරීව කටයුතු කරයි.<br>• සමාජය විෂයෙහි ඉටුකළ යුතු යුතුකම් නොපිරිහෙලා ඉටුකරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 07.<br>සත්‍යය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් තම ජීවන දර්ශනය ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි. | 7.1<br>ජීවන ගැටලු විසඳීමෙහිලා චතුරාර්ය සත්‍යයේ උපයෝගීතාව වටහාගෙන අන්තගාමීත්වයෙන් තොරව කටයුතු කරයි. | • චතුරාර්ය සත්‍යය<br>• කාමසුඛල්ලිකානු යෝගය, අත්තකිලමථානු යෝගය හා මධ්‍යම ප්‍රතිපදාව<br>• චතුරාර්ය සත්‍යය ඇසුරෙන් ගොඩනැගෙන ජීවන දර්ශනය<br>• ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ලෞකික හා ලෝකෝත්තර උපයෝගීතාව | • චතුරාර්ය සත්‍යය විවරණය කරයි.<br>• අන්තගාමීත්වය බැහැර කළ යුතු බව පිළිගනියි.<br>• මැදුම් පිළිවෙත සිය ජීවන දර්ශනය කර ගනියි.<br>• ජීවිතයේ යථාර්ථය පිළිබඳ අවදිකමින් ජීවත් වෙයි. | 25 |
| | 7.2<br>සන්තානගත හා සමාජගත දුකෙහි හේතුඵල සම්බන්ධය දැන යථාර්ථවාදීව ක්‍රියා කරයි. | • පටිච්චසමුප්පාදය<br>• ශාස්වත සහ උච්ඡේද දෘෂ්ටි විචාරය<br>• සන්තානගත දුක සහ සංස්ථාගත දුක ගොඩනැගෙන අයුරු | • පටිච්චසමුප්පාදය විවරණය කරයි.<br>• ශාස්වත උච්ඡේද දෘෂ්ටි බැහැර කළ යුතු බව පිළිගනියි.<br>• දෛනික ජීවිතයේ දී සන්තානගත දුක අවම කර ගැනීමට කටයුතු කරයි.<br>• දෘෂ්ටි බැහැර කර නිදහස් මනසකින් දිවි ගෙවයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 08.<br>බුදුදහමෙහි මානව කේන්ද්‍රීය බව තේරුම් ගෙන බෞද්ධ ආචාරධර්මවලට අනුගත සාර්ථක ජීවිතයක් ගොඩනගා ගනියි. | 8.1<br>මානව ස්වාමීත්වය හා ශක්‍යතා පසක් කර සිය විභවයතා වර්ධනය කර ගනියි. | • මිනිසාගේ ස්වාමීත්වය සහ ශ්‍රේෂ්ඨත්වය<br>• ස්වච්ඡන්දතාව, වගකීම හා මිනිසාගේ කායික මානසික ශක්‍යතා<br>• කුසලාකුසල විනිශ්චය කිරීමේ බෞද්ධ නිර්ණායක | • පුද්ගල ස්වාමීත්වය, ශක්‍යතාව හා වගකීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පැහැදිලි කරයි.<br>• පෞරුෂ සංවර්ධනයට පෙළඹෙයි.<br>• අභියෝග ජය ගනියි.<br>• ආත්ම විශ්වාසයෙන් කටයුතු කරයි. | 30 |
| | 8.2<br>කර්මය, පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ විශ්වාසයෙන් සදාචාරාත්මක ජීවිතයකට හුරු වෙයි. | • දසකුසල් හා දස පුණ්‍ය ක්‍රියා , පංච ශීලය, අෂ්ටාංග ශීලය, ආජීව අෂ්ටමක ශීලය හා දස ශීලය<br>• සතර බ්‍රහ්ම විහරණ<br>• ශ්‍රද්ධාව හා භක්තිය අතර වෙනස<br>    • අමූලිකා ශ්‍රද්ධාව ආකාරවතී ශ්‍රද්ධාව<br>    • කර්මය හා පුනර්භවය | • කුසලාකුසල කර්ම හා පුනර්භවය පිළිබඳ බෞද්ධ විවරණය ඉදිරිපත් කරයි.<br>• කර්මඵල සිද්ධාන්තය පිළිගනියි.<br>• සදාචාරාත්මක ජීවිතයක් ගත කරයි.<br>• සමාජ සාරධර්ම සංරක්ෂණයට දායක වෙයි. | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 09.<br>බෞද්ධ ආර්ථික හා දේශපාලන චින්තනය තේරුම් ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | 9.1<br>ධනෝපායනය හා කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පදනම් කරගත් දැහැමි දිවිපෙවතක් ගත කරයි. | • ධනය පිළිබඳ බෞද්ධ ආකල්පය<br>• ඉපයීම, ආයෝජනය හා පරිභෝජනය<br>• ආර්ථික සුරක්ෂිතතාව හා සම්පත් කළමනාකරණය<br>• ආර්ථිකය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පදනම් කරගත් ජීවන දර්ශනය | • ධනෝපායනය හා කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විශ්ලේෂණය කරයි.<br>• ගෘහස්ථ ජීවිතයට ආර්ථික සමෘද්ධිය අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පිළිගනියි.<br>• ධාර්මිකව ධනය උපයයි.<br>• බෞද්ධ ආර්ථික දර්ශනයට අනුකූලව ජීවත් වෙයි. | 30 |
| | 9.2<br>බෞද්ධ දේශපාලන මූලධර්ම අධ්‍යයනය කර දැහැමි පාලනයකට දායක වෙයි. | • බෞද්ධ දේශපාලන මූලධර්ම<br>- දස රාජධර්ම<br>- දස සක්විතිවත්<br>- සප්ත අපරිහානීය ධර්ම<br>- සතර අගති විරතිය<br>- සතර සංග්‍රහ වස්තු<br>- පඤ්ච සීලය<br>- රාජ්‍ය පාලනයට අදාළ වෙනත් ඉගැන්වීම්<br>• බෞද්ධ දේශපාලන මූලධර්ම තුළින් ගොඩනැගෙන ධර්මිෂ්ඨ රාජ්‍යය | • බෞද්ධ දේශපාලන මූලධර්ම අධ්‍යයනය කරයි.<br>• බෞද්ධ දේශපාලන මූලධර්ම යහපත් පාලන තන්ත්‍රයක් සඳහා පදනම බව පිළිගනියි.<br>• ප්‍රජා නායකයකු ලෙස සමාජ සුභසාධන කටයුතුවල නිරත වෙයි.<br>• දැහැමි පාලන තන්ත්‍රයක් උදෙසා දායක වෙයි. | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.<br>බෞද්ධ භාවනාවේ අගය වටහාගෙන එය ජීවන ගැටලු විසඳා ගැනීමෙහිලා ප්‍රායෝගිකව භාවිත කරයි. | 10.1<br>බෞද්ධ භාවනාවේ සුවිශේෂතා හැඳින එහි උපයෝගීතාව පරීක්ෂා කරයි. | • බෞද්ධ භාවනාවේ සුවිශේෂත්වය<br>• සමථ විදර්ශනා භාවනා<br>• සතර සතිපට්ඨාන<br>• සතර කමටහන්<br>• කර්මස්ථාන ආචාර්යවරයා සතු ගුණාංග<br>• යෝගාවචරයාගේ චරිත ලක්ෂණ පිළිබඳ සරල හැඳින්වීමක් | • භාවනාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විස්තර කරයි.<br>• බෞද්ධ භාවනාවේ උපයෝගීතාව පිළිගනියි.<br>• නිරන්තරයෙන් සිහි නුවණින් ජීවත් වෙයි.<br>• ගැටුම් නිරාකරණයෙහිලා දායකත්වය සපයයි. | 30 |
| | 10.2<br>භාවනාව ප්‍රායෝගිකව ප්‍රගුණ කරමින් සාමකාමී දිවිපෙවෙතක් ගත කරයි. | • බුද්ධානුස්සති භාවනාව<br>• මෛත්‍රී භාවනාව<br>• ආනාපානසති භාවනාව<br>• භාවනාවේ අනුසස්<br>• භාවනාව හා ධාරණ ශක්තිය<br>• භාවනාව හා කායික මානසික සෞඛ්‍යය<br>• භාවනාව හා ගැටලු නිරාකරණය<br>• භාවනාවේ උපයෝගීතාව පිළිබඳ නූතන ඇගයීම් | • භාවනාවේ ප්‍රායෝගික වටිනාකම පැහැදිලි කරයි.<br>• භාවනාව කායික මානසික නිරෝගීතාව සඳහා සෘජුව බලපාන බව පිළිගනියි.<br>• දෛනිකව භාවනාවක නියැලී ධාරණ ශක්තිය වැඩිදියුණු කරගනියි.<br>• කායික මානසික නීරෝගීතාව ඇති කරගෙන යහපත් ජීවිතයක් ගත කරයි. | 30 |

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන්

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන අවධියේ ශිෂ්‍යයාට බුද්ධ ධර්මය විෂය පිළිබඳ අදාළ නිර්දේශ අනුව දැනුමක් ලබා දී ඇත. මූලික ධර්ම කරුණු සාමාජික, සංස්කෘතික හා දේශපාලන යන කරුණු ඔස්සේ වඩාත් පුළුල්ව අධ්‍යයනය කිරීමක් බෞද්ධ ශිෂ්ටාචාරය විෂයය යටතේ බලාපොරොත්තු වේ. එනිසා අ.පො.ස. (උ.පෙළ) සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කළ යුතු වේ.

බෞද්ධ අධ්‍යාපනයේ විෂය ක්ෂේත්‍රය ඉතා පුළුල් ය. ගැඹුරුය. බෞද්ධ ඉගැන්වීම්වල ජීවිතයේ ගැඹුරු ධර්ම කරුණු මෙන්ම සරල බාහිර පැත්තක් ද ආචාර විද්‍යාත්මක කරුණු ද ඇතුළත් ව පවතී. දත් දෙයින් නොදත් දෙයට යාම බෞද්ධ ඉගැන්වීම වන අතර නූතන අධ්‍යාපන විද්‍යාවේ ද එය පිළිගෙන ඇත. ගුරුභවතා මග කියන්නෙක් මෙන්ම අධීක්ෂකයෙක් ද වන අතර ශිෂ්‍යයාට ඉගෙනුම සඳහා පහසුකම් සලසන්නා ද වේ. බුදු දහමෙහි මෛත්‍රිය, කරුණාව, දයාව වැනි උසස් ආකල්ප වර්ධනය කිරීමටත්, බුද්ධි වර්ධනය, විමංශනය, තර්කනය, පරිකල්පන ශක්තීන් අවධාරණය කිරීමටත් සුදුසු පරිදි විෂය නිර්දේශය සකස් කර ඇත. ශිෂ්‍යයාගේ ආකල්ප වඩා වර්ධනය වීමට අවශ්‍ය පරිසරය ගුරුභවතා විසින් ලබා දිය යුතුය.

මෙහිදී මෙම විෂයය උගන්වන ගුරුභවතා බෞද්ධයකු වීම අනිවාර්ය විය යුතු අතර, ඔහු/ඇය විෂය විශේෂඥයකු වීම අවශ්‍ය වේ. එමෙන්ම ආගමික ප්‍රතිපත්ති සුරකින, ගරු කරන, ආගමික හැදියාවකින් යුක්ත අයකු වීම අත්‍යවශ්‍ය ය. විෂය ඉගැන්වීමේ දී සුදුසු පරිදි පන්ති වටපිටාව සකස් කර ගැනීමට ගුරුවරයාට මෙම කරුණු උපකාරවත් වේ.

බෞද්ධ ආගමික සංසදයක් ආරම්භ කොට ඒ මගින් ශිෂ්‍ය දක්ෂතා, හැකියා ඔප් නංවන්නට කටයුතු සැලසුම් කළ යුතුය. මේ මගින් බෞද්ධාගමික සාරධර්ම සම්බන්ධ වූ භාවනා, පිරිත්, ධර්ම සාකච්ඡා, ධර්ම දේශනා, දානමය පින්කම් සංවිධානය කිරීමට ගුරුභවතා විසින් ශිෂ්‍යයා යොමු කළ යුතුවේ. මෙම කරුණුවලට අමතරව බුද්ධි මණ්ඩල සාකච්ඡා, වාර ප්‍රකාශන, ක්ෂේත්‍ර චාරිකා, අධ්‍යාපන චාරිකා සැලසුම් කළ යුතු වේ.

මෙම අවස්ථාවලින් ලබන අත්දැකීම් ඔස්සේ ශිෂ්‍යයාගේ දැනුම, අකල්ප, කුසලතා වර්ධනයට සහ යහපත් ජීවන දර්ශනයක් ගොඩනැංවීමට අවශ්‍ය යහ පුරුදු ගොඩ නැගීමට හැකිවන සේ සැලසුම් සැකසිය යුතුය.

පාරිසරික සංරක්ෂණයට අදාළ වන ගෙවතු වගා, පාසල් භූමි අලංකරණය, ජල සංරක්ෂණය හා කළමනාකරණය, වන වගා ව්‍යාපෘති සඳහා ශිෂ්‍ය දායකත්වය ලබා ගත යුතුය. පරිසරය සුරක්ෂිත කිරීමේ ඇති වටිනාකම ශිෂ්‍යයන්ට ලබාදීමට මෙම වැඩ පිළිවෙල වැදගත් වේ. මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ දී ශිෂ්‍ය කේන්ද්‍රීයව සැලසුම් සකස් කිරීම ගුරුභවතාගේ වගකීමකි. මෙහි දී බෞද්ධාගමික ඉගැන්වීම් ඉස්මතු වන පරිදි සැලසුම් කිරීමට නොකිරීම වැදගත් වේ. පාසල පදනම් කරගත් ක්‍රියාවල දී සෑම අවස්ථාවක ම සටහන් තබා ගැනීමට ශිෂ්‍යයා යොමු කිරීම තුළින් වඩාත් ක්‍රමවත් ව නිරවුල් ව කටයුතු කිරීමේ අවස්ථාව සලස්වා දිය හැකිය. මෙම කරුණු සැකසීමේ දී වාර්ෂිකව සැලසුමක් ඔස්සේ ක්‍රියාත්මක කිරීම වඩාත් ඵලදායක වනු ඇත.

වසර දහතුනක් තිස්සේ ලත් ආගමික අධ්‍යාපනය මත වැඩදායක පුරවැසියකු සමාජයට උරුම කිරීමට හැකි අයුරෙන් පාසල් ප්‍රතිපත්ති හා ඒ හා අදාළ වැඩ සටහන් සම්පාදනය වීම වැදගත් ය.

## තක්සේරුව හා ඇගයීම

- පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙල යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම්, ඇගයීම් හා උපකරණ, නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.
- 13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය.
- මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2019 වර්ෂයේ දී පැවැත්වේ.
- මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.

## විෂය නිර්දේශය සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක මාහිමිපාණන් වහන්සේ | - | හිටපු කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. |
| මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි | - | හිටපු මහාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය. |
| පූජ්‍ය නාඹටුන්නේ විමලඤාණ හිමි | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය. |
| පූජ්‍ය උඩුගම සුදස්සී හිමි | - | දෙපාර්තමේන්තු ප්‍රධාන, ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |
| පූජ්‍ය මඩාටුගම සුරක්ඛිත හිමි | - | ගුරු සේවය , මඩාටුගම, ශ්‍රී පේමානන්ද විද්‍යායතන පිරිවෙන. |
| මහාචාර්ය උදිත ගරුසිංහ මහතා | - | මහාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය. |
| පී.ඒ. සරත්කුමාර මහතා | - | ගුරු සේවය, තක්ෂිලා මහපිරිවෙන, කඩුවෙල. |
| ආර්.එම්.ටී.ටී. රත්නායක මහතා | - | ගුරු සේවය, ශ්‍රී විමලධර්ම මහපිරිවෙන, දන්ගොල්ල, මහනුවර. |